රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :- 364

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1987 අප්‍රේල් මස 1 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් සඳහා**
**බඳවා ගැනීමේ පරිපාටි/කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

1986 සැප්තැම්බර් මස 02 දිනැති අංක 341 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

02. 1986.07.17 දිනැති අංක 327(III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 1986.05.02 දිනැති අංක 327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8(1) වැනි ඡේදය කරුණාකර බලන්න. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පහත සඳහන් ආකාරයට විය යුතුය.

03. I වන කාර්යක්ෂමතා කඩඉම

(අ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කරන නිලධාරියෙකු ඔහුට අදාල වැටුප් ක්‍රමයේ රු. 20,400/= ට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

ඒ සඳහා නියමිත විෂයයන් පහත සඳහන් වේ.

I. මූල්‍ය ක්‍රම
II. පරිපාලනය
III. දෙපාර්තමේන්තු රෙගුලාසි

(ආ) ඉහත කී විෂයයන් සඳහා විෂය නිර්දේශය 'අ' පරිශිෂ්ටයේ දක්වා ඇත.

(ඇ) දැනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා අනෙකුත් රජයේ සේවා වල නිලධාරීන් සඳහා පැවැත්වෙන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට ඇතුලත් ඉහතකී විෂයයන් සඳහා වූ විභාග වලට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් ද පෙනී සිටිය යුතුය. විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට එකී පරීක්ෂණයට පෙනී සිටීම සඳහා විභාග කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කටයුතු කරනු ලැබේ.

(ඈ) ඉහත 03(අ) ඡේදයේ (III) සඳහන් "දෙපාර්තමේන්තු රෙගුලාසි" වෙනස් වන නිසා විද්‍යාත්මක සේවයේ සියළුම නිලධාරීන්ට පොදු පරීක්ෂණයක් පැවැත්වීම අපහසුය. එබැවින් මෙම විෂය සඳහා විෂය නිර්දේශ සකස් කර ඒ සඳහා ආයතන අධ්‍යක්ෂගේ අනුමතිය ලබාගෙන අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමතිය ඇතිව වර්ෂයකට දෙවතාවක් බැගින් එම පරීක්ෂණ පැවැත්වීමට අදාල සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියා කළ යුතුයි.

..2..

සටහන් (I) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත් කරන නිලධාරියෙකු අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන්නේය. ඔහු,

(අ) I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්ද,

(ආ) සිංහල සම්බන්ධයෙන් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙන්ද සමත් වී ඇත්නම්, වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නම්, මෙම කාලසීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

(II) අවුරුදු තුනක් අවසානයේදී නිලධාරියා මෙම පරීක්ෂණයෙන් සමත් වී නොමැති නම් ඔහුගේ පත්වීම අවසන් කිරීමට ඉඩ ඇත.

(III) අදාල් ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා රු. 20,400/= වැටුප් තලයට වඩා ඉහල වැටුප් තලයක පිහිටුවනු ලබන නිලධාරියෙකු අවුරුදු දෙකක් ඇතුලතදී I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

04. <u>2 වන කාර්යක්ෂමතා කඩඉම</u>

(I) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වෙනි පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියෙකු ඔහුට අදාල වැටුප් ක්‍රමයේ රු. 24,600/= වාර්ෂික වැටුප් පියවරට පැමිණීමට ප්‍රථම 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(II) ඒ සඳහා දැනට බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් නියමයන්ට අනුකූල වන සේ අදාල ක්ෂේත්‍රයේ නියමිත අභ්‍යාස පාඨමාලා වක් සාර්ථක ලෙස හැදෑරීම හා/හෝ අදාල ක්ෂේත්‍රයේ එම්. ඒ., එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධියක් සමත් වී පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගත යුතුය.

(III) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වයස අවුරුදු 45 ට එළඹී විට I වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලින් නිදහස් කිරීමට ඉඩ ඇත. එහෙත් එම නිලධාරියා පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබන තෙක් II පන්තියේ II ශ්‍රේණියෙන් ඔබ්බට උසස් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

05. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් I වන හෝ 2 වන හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කිරීම, නිදහස් කිරීම හා කාලය දීර්ඝ කිරීම වැනි ඕනෑම ඉල්ලීමක් නිලධාරියා විසින් පත් කිරීමේ බලධාරියා වන රාජ්‍ය පරිපාලන ලේකම් හා විද්‍යාත්මක සේවා මණ්ඩලයේ සභාපති වෙත අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

/..3..

06. <u>බඳවා ගැනීමේ පරිපාටි</u>

(I) 1980.02.13 දිනැති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ (02) ඡේදය හා ඉහත 02 ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරන අතර, ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක සේවයට අයත්, සියළුම නිලධාරීන්ගේ තනතුරු සඳහා වූ දැනට ඇති බඳවා ගැනීමේ පරිපාටි මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලට අනුකූල වන සේ සංශෝධනය කරවා ගැනීමට කරුණාකර දින 30 ක් ඇතුලතදී කටයුතු කරන්න.

(II) බඳවාගැනීමේ පරිපාටි සංශෝධනය කරවා ගැනීම සඳහා කරන ඉල්ලීම් සියල්ලම විද්‍යාත්මක සේවා මණ්ඩලයේ ලේකම්ටද පිටපතක් සහිතව, ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයෙහි නියම කර ඇති පරිදි ආයතන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

(III) ඒ ඒ තනතුරු දරණ නිලධාරීන් 1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවා යාමට පෙර සමත් විය යුතු විභාග, පුහුණුව හා ලබා ගත යුතු පශ්චාත් උපාධි යනාදිය බඳවාගැනීමේ පරිපාටියෙහි නිශ්චිතව සඳහන් කළ යුතුය.

(IV) දැනට අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් සුදුසුකම් අඩු කිරීමට අවසර දෙනු නොලැබේ.

(V) නිසි පරිදි සංශෝධනය කරවා ගත්, විද්‍යාත්මක සේවයට අයත් තනතුරු සඳහා වූ අදාල බඳවා ගැනීමේ පරිපාටි වල සහතික කළ පිටපත් විද්‍යාත්මක සේවා මණ්ඩලයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(VI) 1987.04.01 දිනට පසු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පත් කිරීම්, උසස් කිරීම් හා ඇබෑර්තු පිරවීම් ආදී සියළු කටයුතු සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව සිදු කරනු නොලැබේ.

07. කරුණාකර මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අදාල සියළුම නිලධාරීන්ගේ දැනගැනීමට සලසන්න.

08. කරුණාකර මෙම චක්‍රලේඛය ලැබුණු බව දන්වන්න.

Siriwardhana

( ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන )
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

## 'අ' පරිශිෂ්ටය

( ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරීන් සඳහා පැවැත්වෙන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ නිර්දේශ පත්‍රය. )

1. I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

   (I) මූල්‍ය ක්‍රම
   (II) පරිපාලනය
   (III) දෙපාර්තමේන්තු රෙගුලාසි

2. I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර තිබේ.

3. සෑම ප්‍රශ්න පත්‍රයක්ම පැය 3 ක කාලයක් වේ.

4. විභාග පරිපාටිය -

### (I) මූල්‍ය ක්‍රම

පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක් -

(අ) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි, I වැනි කාණ්ඩය ( X වැනි පරිච්ඡේදය හැර )

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු උදා: ඒවා සකස් කිරීම, ආදායම් ශීර්ෂ, මූල්‍ය ක්‍රම හා විසර්ජන පනත් :

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිලිබඳ ආඥා පනත්.

සටහන - අපේක්ෂකයෙකු ලකුණු සියයට 40 ක් ලබා ගත යුතුය.

### (II) පරිපාලනය

පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක් :-

(අ) කාර්යාල සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම :

(ආ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XVI, XXI, XXIV, XXIX, XXX, XXXIII, XXXV, XXXVI, XXXVIII, XXXIX, XLI, XLIII, XL XLVII, සහ XLVIII.

සටහන - අපේක්ෂකයෙකු ලකුණු සියයට 40 ක් ලබා ගත යුතුය.

### (III) දෙපාර්තමේන්තු රෙගුලාසි

කරුණාකර චක්‍රලේඛයේ 03 ඡේදයේ (ඇ) වගන්තිය බලන්න.

සටහන - අපේක්ෂකයෙකු ලකුණු සියයට 40 ක් ලබා ගත යුතුය.